භාෂාවක් මගින් සමාජයක චින්තනය හැඩගැස්වීමට සිදුකරනා බලපෑම අප විසින් මේ වනවිට නැවත නැවතත් සංවාදයට ගෙන ඇතිවාක් මෙන්ම, ශිෂ්ට සම්පන්න සිතුම් පැතුම් හා ආකල්ප දියුණු කිරීම උදෙසා මාධ්‍ය මගින් ශිෂ්ට සම්පන්න භාෂාවක් යොදාගැනීමේ වැදගත්කමද එසේම කථාබහට ලක් කොට ඇත.

කෙසේ නමුත්, තවමත් මෙම වඩාත් ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක් සඳහා අනුගත වීමට ඇතැම් මාධ්‍යයන්ට නොහැකි වී තිබීම සැබවින්ම කණගාටුවකි. උදාහරණ ලෙසින් "කොරෝනා මනමාලි මනමාලයා", "කොරෝනා කතුන්" වැනි යෙදුම් දැක්විය හැක.

සිරස්තලයක් යෙදීමේදී අවම වචන ප්‍රමාණයකින් අදහසක් දැක්වීමට අවශ්‍ය වීම අපට තේරුම් ගත හැක. කෙසේ වෙතත්, මෙවන් නිෂේධනාත්මක යෙදුම් ජනගත කිරීම සඳහා එය නිදහසට කරුණක් වේ යැයි ඔබ සිතන්නේද? කොවිඩ්-19 වසංගතය හා ලෝකයම සටන් වැද සිටිනා මේ මොහොතේදී, කොවිඩ්-19 ආසාදිතයින් සහ නිරෝධායනයට ලක් කොට සිටින්නන් කෙරෙහි සමාජ කොන් කිරීමක් නිර්මාණය කිරීමටද මෙම අයෝග්‍ය භාෂා භාවිතය හේතු නොවන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TV #NewsPapers #Coronavirus #SathiAgaAruna #Lankadeepa**